11 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව

02

## ගෘහීය සම්පත් ඵලදායී ලෙස උපයෝගී කර ගනී

# ක්‍රියාකාරකම් පත්‍රිකාව

## ගෘහීය සම්පත් කළමනාකරණය

උපදෙස් - පෙළපොතේ ගෘහීය සම්පත් කළමනාකරණය පාඩම කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

1. කළමනාකරණ ක්‍රියාවලියේ පළමු පියවර වනුයේ,

I ඇගයීමයි　　II ක්‍රියාත්මක කිරීමයි
III සැලසුම් කිරීමයි　　IV සංවිධානය කිරීමයි

2. ශ්‍රමය කළමනාකරණයේදී වැදගත් වනුයේ,

I ශ්‍රම විභජන සටහනයි　　II කාර්ය සටහනයි
III අයවැය ලේඛනයයි　　IV කාල සටහනයි

3. කාලසටහනක් සැලසුම් කිරීමේදී අවධානය යොමු නොවන කරුණක් සේ සැලකිය හැක්කේ,

I ගෘහ කාර්යයන්හි ප්‍රමුඛතා අනුපිළිවල තීරණය කිරීම

II ගෘහය තුළ කාර්ය බහුල වේලාවන් ගැන සැලකිලිමත් වීම

III ගෘහ සාමාජිකයන්ට ගෘහ කාර්යයන් සඳහා යොමු විය හැකි වේලාවන් සලකා බැලීම

IV පවුලට ලැබෙන ආදායම් මාර්ග පිළිබඳ සැලකිලිමත් වීම

4.අයවැය ලේඛනයක් යනු,

I. පුද්ගලයෙකුට කළ හැකි කාර්ය ප්‍රමාණය අනුව කාර්යභාර වෙන් කරන සටහනකි

II. ගෘහ කාර්යයන් සඳහා කාලය වෙන් කර ගැනීමේ සටහනකි

III. පවුලේ ආදායම් හා වියදම් තුලනය කරමින් සකසන සටහනකි

IV. ගෘහ සාමාජිකයින්ගේ මානසික සුවය සලසා ගැනීමේ ක්‍රමවේද ඇතුලත් සටහනකි

5. සමස්ත කළමනාකරණ ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව සොයා බලනුයේ,

I. ඇගයීමේ පියවරෙනි II. ක්‍රියාත්මක කිරීමේ පියවරෙනි
III. සැලසුම් කිරීමේ පියවරෙනි IV. සංවිධානය කිරීමේ පියවරෙනි

පිළිතුරු සපයන්න.

1)

1 . කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් වී ඇති සරල අර්ථ දැක්වීමක් ලියා දක්වන්න. (ලකුණු 02)

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

2. ශ්‍රම විභජන සටහනක් යනු කුමක්ද ( ලකුණු 02)

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

3. ගෘහීය අයවැය ලේඛනයක් සැකසීමේදී සැලකිය යුතු කරුණු 3ක් දක්වන්න. (ලකුණු 03)

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

4. ගෘහ කාර්යය මැනවින් ඉටු කර ගැනීමට ඒවා සං සංවිධානය කළ යුතු වන්නේ කෙසේද ( ලකුණු 03)

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

------------------------------------------------------------------------

**පිළිතුරු පත්‍රය**

1. III 2. I 3. II 4. III 5. I

1)

1. **අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සීමිත සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය කළමනාකරණ ක්‍රියාවලියයි.**

**නැතහොත්**

**අපේක්ෂිත අරමුණු කරා යාම සඳහා නිශ්චිත පියවර ඔස්සේ ක්‍රියාත්මක වන ක්‍රියාවලිය කළමනාකරණ ක්‍රියාවලියයි**

**යන පිළිතුරු දෙකෙන් එකක්**

2. **ශ්‍රම විභජන සටහනක් යනු එක් එක් පුද්ගලයෙකුට කළ හැකි කාර්ය ප්‍රමාණය අනුව කාර්යභාරය වෙන් කරන සටහනකි.**

3. ⁎. සියලුම ආදායම් මාර්ග වලින් ලැබෙන මුදල් ප්‍රමාණය

⁎. පවුලේ සාමාජික සංඛ්‍යාව හා ඔවුන්ගේ අවශ්‍යතා

⁎. පවුලේ අත්‍යවශ්‍ය වියදම්

⁎. අතිරේක වියදම්

⁎. ඉතිරි කිරීම්

යන කරුණු වලින් තුනක්

4. ගෘහ කාර්යයන් සංවිධානයේදී එය මැනවින් සිදු කර ගැනීම සඳහා ඒ ඒ කාර්යය සැලසුම් කිරීමේදී සකසන ලද කාර්ය සටහන , කාල සටහන, අයවැය ලේඛනය අනුව අදාළ කාර්යයන් පවුලේ සාමාජිකයින් වෙත භාර දීම මගින් ඒවා මැනවින් සංවිධානය කර ගත හැකිවේ.